# SLPMS

## සී/ස. ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා (පුද්ගලික) සමාගම

ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා සමාගමේ නැගෙනහිර බහාලුම් පර්යන්තය හා සමග සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) සහ සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) වශයෙන් සම්බන්ධ කර ගැනීම සඳහා උසස් සුදුසුකම් හා පළපුරුද්ද සහිත අය බඳවා ගැනීමට බලාපොරොත්තු වේ.

## 1. සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණය) තනතුර නැගෙනහිර කොළඹ බහාලුම් පර්යන්තය (CECT)

**අවශ්‍ය සුදුසුකම් :**

1. **අධ්‍යාපන සුදුසුකම් :**

➢ පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ හෝ සම්බන්ධ ක්ෂේත්‍රයක මාස්ටර්ස් උපාධිය

2. **සේවා පළපුරුද්ද**

අයිටී (IT) අංශයේ වසර 10 ක සනාථ කළ පළපුරුද්ද හා ජ්‍යෙෂ්ඨ IT කළමනාකරණ භූමිකාවන්හි වසර 05 ක පළපුරුද්ද, සමුද්‍රීය, සැපයුම් දම හා සැපයුම් සේවා (ලොජිස්ටික්ස්) කර්මාන්තය පිළිබඳ තම් මැනවි.

3. **අනෙකුත් මෘදු නිපුණතා**

- IT යටිතල පහසුකම්, පද්ධති, ජාල දත්ත සමුදාය කළමනාකරණ හා සුරක්ෂණය පිළිබඳ ප්‍රබල තාක්ෂණික කෘතහස්තභාවය
- සාර්ථක IT ව්‍යාපෘති හා මූලපිරීම් පිළිබඳ සනාථ කළ ක්‍රියා සාධනය.
- උපාය මාර්ගික චින්තනය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව.
- විශිෂ්ඨ නායකත්ව, සන්නිවේදන හා අන්තර් පුද්ගල නිපුණතා
- අද්විතිය හා අති වේගවත් පරිසරයක ඵලදායීව ක්‍රියාකිරීමේ හැකියාව.

**වගකීම් :**

- CECT හි සමස්ත ව්‍යාපාර අරමුණු හා පෙළගැසුණු IT උපායමාර්ග සංවර්ධනය කොට ක්‍රියාත්මක කිරීම
- පර්යන්ත මෙහෙයුම් පද්ධති (TOS) ස්වයංක්‍රීය පද්ධති සහ වෙනත් අදාළ මෘදුකාංග විසඳුම් (මූල්‍ය පද්ධති/ මානව සම්පත් තොරතුරු පද්ධති) වැනි විවිධ IT පද්ධතීන්හි සුමුදු ඒකීකරණය අධීක්ෂණය කිරීම.
- පර්යන්ත මෙහෙයුම් සඳහා සහාය වීමට ජාල, සර්වර් හා දත්ත සමුදාය ඇතුළු IT යටිතල පහසුකම්වල සවිමත් බව සහ විශ්වාසනීයත්වය සහතික කරලීම.
- සංවේදී දත්ත සහ පර්යන්ත මෙහෙයුම් සයිබර් තර්ජන වලින් රැක ගැනීමට විස්තීර්ණ සයිබර් සුරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කොට පාලනය කිරීම.
- කාලීන සහාය, නඩත්තුව සහ IT පද්ධති උත්ශ්‍රේණිගත කිරීම සහතික කරලීමට IT අලෙවිකරුවන් හා සේවා සපයන්නන් සම්බන්ධීකරණය කිරීම.
- පිරිවැය ඵලදායීත්වය සහ ප්‍රශස්ත බව සහතික කරමින් IT අයවැය සංවර්ධන කොට පාලනය කිරීම.
- IT මෙහෙයුම් හා දත්ත සුරක්ෂණයට බලපාන අදාළ කර්මාන්ත රෙගුලාසි සහ ප්‍රමිතීන් හා සමග අනුකූල වීම.
- IT පද්ධතීන්හි සැකසුම් වැඩි දියුණු කිරීම හා නවෝත්පාදනය සඳහා සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පාරිභෝගික තෘප්තිය සඳහා අවස්ථාවන් හඳුනා ගැනීම.

## 2. සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුර නැගෙනහිර කොළඹ බහාලුම් පර්යන්තය (CECT)

**අවශ්‍ය සුදුසුකම්**

1. **අධ්‍යාපන සුදුසුකම් :**

මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක මාස්ටර්ස් උපාධිය.

2. **වෘත්තීය සුදුසුකම් :**

මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වරලත් සුදුසුකම්

3. **සේවා පළපුරුද්ද**

මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වසර 10 ක සනාථ කළ පළපුරුද්ද සහ ජ්‍යෙෂ්ඨ මානව සම්පත් කළමනාකරණ භූමිකාවන්හි වසර 05 ක පළපුරුද්ද සමුද්‍රීය, සැපයුම් දම හා සැපයුම් සේවා (ලොජිස්ටික්ස්) කර්මාන්ත පිළිබඳ තම් මැනවි.

4. **අනෙකුත් මෘදු නිපුණතා**

මානව සම්පත් ව්‍යවහාරයන්, කම්කරු නීති හා රෙගුලාසි පිළිබඳ සවිස්තර දැනුම.

- විශිෂ්ඨ නායකත්ව, සන්නිවේදන හා අන්තර් පුද්ගල නිපුණතා
- උපාය මාර්ගික චින්තනය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව.
- අද්විතිය අති වේගවත් පරිසරයක ඵලදායීව ක්‍රියාකිරීමේ හැකියාව.

**වගකීම්**

- CECT හි සමස්ත ව්‍යාපාර අරමුණු හා පෙළ ගැසුණු HR උපාය මාර්ග සංවර්ධනය කොට ක්‍රියාත්මක කිරීම.
- බඳවා ගැනීම්, පුහුණු කිරීම්, කාර්ය සාධන කළමනාකරණය සහ සේවක සබඳතා ඇතුළු සියලුම මානව සම්පත් (HR) ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.
- පර්යන්ත මෙහෙයුම් හා කර්මාන්ත මනා ව්‍යවහාරයන් හා සමග පෙළගැසීම සහතික කරලමින් CECT සේවකයන්ගේ නිපුණතා, දැනුම සහ හැකියාවන් තීව්‍ර කිරීම සඳහා අභ්‍යාස හා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කොට ක්‍රියාත්මක කිරීම.
- කාර්ය සාධන කළමනාකරණ පද්ධතීන් ක්‍රියාත්මක කරලීම
- සියලුම අදාළ කම්කරු නීති, රෙගුලාසි හා කර්මාන්ත ප්‍රමිතීන් හා සමග අනුකූල වීම සහතික කරලීම හා නිරවද්‍ය HR වාර්තා හා ලිපිලේඛන පවත්වාගෙන යාම.
- පිරිවැටුම් අනුපාතයන්, බඳවා ගැනීමේ මිනුම්, පුහුණු කිරීමේ ඵලදායීතාව සහ සේවක තෘප්තිය, HR තීරණ ගැනීම් දැනුම් දීම සඳහා අන්තර්දෘෂ්ටිය ලබාදීම වැනි HR දර්ශකයන් සොයා ගැනීමට HR මිනුම් හා විශ්ලේෂිත ක්‍රම සංවර්ධනය කොට පවත්වාගෙන යාම.
- සෞඛ්‍ය හා ආරක්ෂිත රෙගුලාසි හා අනුකූල වීම සහතික කරලීමට අදාළ ආයෝජකයින් හා සමග සහයෝගීව කටයුතු කිරීම.
- සහයෝගී හා අධි කාර්ය සාධන කණ්ඩායම් සංස්කෘතියක් අභිවර්ධනය කරමින් හා කණ්ඩායම් සාමාජිකයන්ගේ වෘත්තීය සංවර්ධනය හා වර්ධනයට සහාය වෙමින් HR කණ්ඩායමට නායකත්වය හා මෙහෙයවීම ලබාදීම.

**වයස් සීමාව :** අවුරුදු 55 ට අඩු විය යුතුය.

**අයදුම් කළ යුතු අන්දම :** ඉහත උපමානයන් සපුරාලන අභිලාෂී අයදුම්කරුවන්ට තම ජීවදත්ත හා ඇමතුම් විස්තර ඇතුළත් අයදුම්පත් "**කොළඹ 01, චෛත්‍ය පාර, නො. 19, සී/ස ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා (පුද්ගලික) සමාගම, ප්‍රධාන විධායක නිලධාරී**" යන ලිපිනයට තැපැලෙන් යොමු කළ යුතුය. නැතහොත් info@slmpcs.lk වෙත ඊමේල් කළ යුතුය.

අයදුම්භාර ගැනීමේ අවසාන දිනය : 2024.05.09

CECT සමාන අවස්ථාවන් සහිත සේව්‍යයකු වේ. මේ පිළිබඳ උනන්දු වූ සියලුම අයදුම්කරුවන්ට අපි ස්තුති වන්ත වෙමු. කෙසේ වෙතත්, සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්බන්ධ කර ගනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී**